විවිධ

සම්මානිත හොවාරිය
කුසුමා කරුණාරත්න

"පුංචි රුවන් පුංචි රුවන් පුංචි කළේ"

ලිඳක් අසල රැඳී සිටිමින් මිහිරි හඬින් කවියක් ගායනා කරමින් සිටින හුරුබුහුට පුංචි දැරියකි. ඇයගේ මුහුණේ සුන්දර පෙනුම වියැකී ගොස් මඳ වශයෙන් කෝපාන්විත බවක් දර්ශනය වෙයි. ළයාන්විත වුවද වේගවත් හඬකින් ඇය තමන්ම නිර්වචනම ප්‍රබන්ධ කළ කුඩා කවිය ගයමින් සැකයෙන් වටපිට බලයි.

"පුංචි රුවන් පුංචි රුවන් පුංචි කළේ
වතුර අරන් ලිඳ උඩ තැබුවාය කළේ
අට පහ නොදන්නා ජඩයෙකි මේක කළේ
ගෙදර යන්න දෙනවද මගෙ පුංචි කළේ"

මොහොතකින් සිනාමුසු මුහුණක්, ලිඳ අසල වූ පඳුරක් අතරින් දෘශ්‍යමාන වෙයි. දැරියගේ මුහුණේ කෝපාන්විත පෙනුම වෙනස් වී ගොස් මඳ සිනාවක් ප්‍රකට වෙයි. ඇය වහ වහා තවත් කවියක් පද බඳිමින් මෙසේ කියයි.

"පුංචි රුවන් පුංචි රුවන් පුංචි කළේ
වතුර අරන් ලිඳ උඩ තැබුවාය කළේ
පත්තායමේ මාමයි දැන් මේක කළේ
ගෙදර යන්න දෙනවද මගෙ පුංචි කළේ"

තම ඥාති දියණියගේ සුරුවිරුකම්වලින් උද්දාමයට පත් පත්තායමේ ලේකම් තුමා 'පුංචි රුවන් පුංචි කළය' ද අනැතිව දැරියට සමීප වෙයි. දෙදෙනා අතර ආදරය සෙනෙහස උතුරා යයි. තම ඥාති දියණියගේ කවි ශක්තිය බාල කලම දැකගන්නට ලැබීමෙන් ඔහු ප්‍රීති ප්‍රමෝදයට පත් වෙයි.

මාතර යුගයේ සිංහල සාහිත්‍යය ගැනත්, විශේෂයෙන්ම මාතර පද්‍යයට සැලකිය යුතු තරම් දායකත්වයක් දුන් කාන්තාවන් ගැනත් විමසන විට අපගේ මතකයට නැංවෙන ගජමන් නෝනා කිවිඳියගේ බාල වියේ තොරතුරු අතර හමු වන විශේෂ තොරතුරකි, ඉහතින් දැක්වූයේ. රුහුණේ කිවිඳියන් අතුරෙන් ප්‍රමුඛස්ථානයෙහිලා සැලකෙන ගජමන් නෝනා ගැන, මාතර සාහිත්‍යය පිළිබඳව පුළුල් විමර්ශනයක යෙදුණ ප.බ.පී. හේවාවසම් මහතා අදහස් දක්වන්නේ මෙසේය.

"යථෝක්ත ගජමන් නෝනා නම් අනෙකක නොව, රුහුණු රට කවි කෝකිලාව නම් විරුදාවලියෙන් පිදුණු දෝන ඉසබෙලා පෙරුමාල් කොරණේලියා නම් කිවිවරිය වෙයි." (මාතර යුගයේ සාහිත්‍යධරයන් හා සාහිත්‍ය නිබන්ධ, ප.බ.පී. හේවාවසම්, 62 පිට)

මෙරට විදේශීය බලපෑමට හසු වී පැවති යුගයක පුද්ගලයන්ගේ නම් ගම් ආදියෙහි ද එම බලපෑම විද්‍යමාන වූ බවට සාක්ෂියකි, ගජමන් නෝනාට උපතේදී පියා දුන් නම. එනම්, දෝන ඉසබෙලා පෙරුමාල් කොරණේලියා යන නම. බාල කල කොළඹ, කොල්ලුපිටිය ප්‍රදේශයේ ජීවත් වූ ඇය, සිය දෙමාපියන් සමග මාතර ප්‍රදේශයේ වාසය සඳහා යන විට යොවන වියේ පසු වී ඇත. එකල සිංහල සමාජය තුළ කාන්තාවන්ගේ අධ්‍යාපනය ගැන වැඩි උනන්දුවක් නොපැවතුණ නමුදු ඇයට පවුලේ මෙන්ම වැඩිහිටි ඥාතීන්ගේ ද, වියත් භික්ෂූන් වහන්සේලාගේ ද උනන්දුව නිසා අකුරු ඉගෙනීමේ අවස්ථාව පෑදුණි. තම මාමා වූ පත්තායමේ ලේකම් නමැති වියත් පුද්ගලයකුගේ උනන්දු කරවීම ඇයගේ සහජ හැකියාව ඔපවත් කරගැනීමට ඉමහත් පිටුබලයක් විය. සැබවින්ම කාන්තාවක ලෙස ඇය ලද එම පිටුබලය ඇයට හිමි වූ විශේෂ වරප්‍රසාදයක් මෙන්ම එමගින් සිංහල කවියට කිසියම් ආලෝකයක් ද ලැබිණ.

මාතර සාහිත්‍ය යුගය වූ කලි ඊට පෙර බෙදා වෙන් කොට තිබූ සාහිත්‍ය යුගවලට වඩා වෙනසක් පෙන්වන්නකි. පෙර අවධිවල සාහිත්‍ය යුග ලෙස බෙදීම සිදු වූයේ ඒ ඒ රජවරුන් රජකම් කළ රාජධානි අනුවය. එසේ නැතහොත් දේශපාලන වශයෙන් බෙදුණ යුග අනුවය. එලෙස යුග වෙන් කිරීමෙහි කිසිසේත්ම නොගැළපීමක් නොවූයේ සාහිත්‍යයේ දියුණුව මෙන්ම පරිහානිය ද එක් එක් රාජධානි අනුව සිදු වෙමින් පැවති තිසයි. කෝට්ටේ යුගය වැනි අවධියක් සිංහල සාහිත්‍යයේ ස්වර්ණමය යුගයක් වූ අතර විදේශීය ආධිපත්‍යය නිසා පිරිහී ගිය මහනුවර යුගයේ සාහිත්‍යය එම අවධියේ දේශපාලන වශයෙන් හරගත් අවුල් වියවුල් හා බද්ධ වී පැවතුණි. මෙවැනි යුග බෙදීම් ක්‍රමයක වෙනස පළමුවෙන්ම දැකගත හැක්කේ මාතර සාහිත්‍ය යුගය සමගය. මාතර රාජධානි යුගයක් නොවූ අතර එම ප්‍රදේශයේ වැඩ වියූ වියත් භික්ෂූන් වහන්සේලා මෙන්ම ගිහි පඬිවරුන් ද අතින් රචනා වූ සාහිත්‍යය එකල වෙනම සාහිත්‍ය යුගයක් ලෙස නම් කිරීමට තරම් ප්‍රමාණවත් පදනමක් විය. එමෙන්ම මාතර සාහිත්‍ය යුගයෙහි කැපී පෙනෙන තවත් ලක්ෂණයක් වූයේ ගද්‍යයට වඩා පද්‍යය ප්‍රචලිත වීමයි. මේ අතර, පූර්ව යුගයන්ට වඩා මෙම යුගයෙහිදී ලේඛිකාවන් කිහිප දෙනකුම සාහිත්‍ය කරණයෙහි නියැළීමත් විශේෂත්වයක් විය.

පැරණි සිංහල සංස්කෘතිය තුළ කාන්තාව පෙරට ඒම දුබල වශයෙන් දක්නට ලැබුණකි. විශේෂයෙන් ශාස්ත්‍රීය දැනුම ලබාගැනීම හා ශාස්ත්‍රීය ලේඛන කාර්යයෙහි නිරත වීම කාන්තා පක්ෂයට අකැප වූවාක් මෙන් ඔවුන් සාහිත්‍ය රචනා කාර්යයෙහි පෙරමුණ ගැනීමක් සිදු නොවිය. මෙවන් පසුබිමක, සාහිත්‍යයේ ප්‍රවර්ධනයක්, විශේෂයෙන්ම පද්‍ය රචනාවල ඉහළ යාමක් මාතර ප්‍රදේශය අවට දක්නට ලැබීමත් සමගම එහෙන් මෙහෙන් හෝ කාන්තාවන් කිහිප දෙනකුවත් සාහිත්‍ය කරණයට පිවිසීම සාධනීය ලක්ෂණයක් විය.

ඉහතින් දැක්වූ කුඩා පද්‍ය ප්‍රබන්ධ සිය මුවින් ගැයූ දැරිය පසු කල වන විට මාතර ප්‍රදේශය පුරාම ප්‍රකට වූ කිවිඳියක් බවට පත් වූවාය. වසර 1746 දී කොළඹ, කොල්ලුපිටිය ප්‍රදේශයේදී, උපත ලද ඇයට වයස අවුරුදු 14 ක් වන විට මාතර ප්‍රදේශයට යාමට සිදු වූයේ තම පවුලේ අය ද එහි වාසයට ගිය බැවිනි. පවුලේ වැඩිමහල් දියණිය වූ දෝන ඉසබෙලා පෙරුමාල් කොරණේලියා එම නම

ලැබුවේ ද එකල රට තුළ ප්‍රචලිතව තිබූ විදේශීය හුරුවක් සහිත නම්ගම් ජනප්‍රිය වී පැවති හෙයිනි. දරුවන් තිදෙනකුගෙන් සමන්විත පවුලක ජීවත් වූ ඇය පසු කලකදී ගජමන් නෝනා නමින් ප්‍රකට වූයේ සිය පියාණන්ගේ වෘත්තිය සමග ඔහුට හිමි වූ ගජමන් ආරච්චි යන නමට සම්බන්ධකමක් ප්‍රකට කරමිනි.

මාතර ප්‍රදේශයේ ජීවිතය ඇරඹූ කොරණේලියානොහොත් ගජමන් නෝනා බාල වියේ සිටම උගත් ගුරුවරුන්ගෙන් මෙන්ම වියත් යතිවරුන්ගෙන් ද අකුරු ඉගෙනීමේ ඉඩ ප්‍රස්තාව ලැබුවාය. පොදුවේ ශාස්ත්‍රීය දැනුම එවැනි උගත් ප්‍රභූවරුන්ගෙන් ලබාගැනීමට වාසනාව ලත් ඇය සිය සහජ කුසලතා උරාගා බලමින් කාව්‍ය කරණයෙහි නියැළෙන්නට වූවාය. එවකට මාතර සිටි ප්‍රකට කවියකු වූ පත්තායමේ ලේකම් සමග තිබූ ඥාති සම්බන්ධතාව ඇයගේ දක්ෂතා, උරගා බැඳීමට ඇයට බෙහෙවින් උපකාරී වූ බව පෙනේ. ගජමන් නෝනාට ශාස්ත්‍රදානය ලබා දීමට යොමු වූ මාතර සාහිත්‍යයේ දිදුලන පඬි හිමිවරුන් ලෙස සිටිනාමලුවේ ධම්මජෝති ස්වාමීන් වහන්සේ, කරතොට ධර්මාරාම නායක හිමි ආදී වියත් භික්ෂූන් වහන්සේලා මාතර සාහිත්‍ය ඉතිහාසයේ කැපී පෙනුණ බව ප්‍රකටය. වසර සියයක පමණ වන (1750 සිට 1850) කාල සීමාවක් මාතර අවධිය ලෙස සැලකුණ අතර එම යුගය මෙවැනි පඬිවරුන්ගේ ඥාන සම්භාරයෙන් හා කාව්‍ය නිර්මාණ කුසලතා සමග වෙනම සාහිත්‍ය යුගයක් ලෙස කැපී පෙනුණි.

ශාස්ත්‍රඥානය ලැබීමට තිබූ ආශාවට අමතරව ගජමන් නෝනා සතුව පැවති සහජ කවි ශක්තිය කිසිසේත්ම මොට විය නොදී දියුණු කරගන්නට ඇයට, එවකට ප්‍රකටව පැවති බෞද්ධ විහාරස්ථාන උපකාරී විය. කාන්තාවන්ට අකුරු ඉගෙනීම අනවශ්‍ය යයි සැලකුණ කාල සීමාවකදී, බාල වියේ පසු වූ ඇය පිරිමි වෙසක් මවාගනිමින්, වෙස්වළාගෙන පන්සලට ගොස් අකුරු ඉගෙන දැනුම ලබාගන්නට තරම් කාර්යශූර වූවාය. එවන් දක්ෂතා ඇය සතුව තිබුණද ඇය තම ජීවිතයේ නොයෙක් අවස්ථාවලදී දුක් වේදනාව හිමි කරගත් ගැහැනියක් ලෙස වාර්තාගත වී ඇත. පොදුවේ ගත් විට මාතර පද්‍ය සාහිත්‍යය, නොදියුණු සාහිත්‍ය යුගයක් ගෙවා අවුත් යන්තමින් ගිස ඔසවන්නට තැත් කළ කාල වකවානුවක් ලෙස විශේෂත්වයක් හිමි කරගනියි. එවන් යුගයක පුරුෂ පක්ෂයේ අය විසින් රචිත කාව්‍ය අතරට ගජමන් නෝනා අතින් ලියවුණ රචනා ද ඉහළම තලයේ නිර්මාණ ලෙස නොසැළකුණත් එදාට ඔබින අන්දමේ කාව්‍ය කෘති බවට පත් විය.

මාතර සාහිත්‍ය සමය සමස්තයක් ලෙස ගත් විට, කවිය පොද්ගලික අවශ්‍යතා ඉටු කරගැනීමේ මාධ්‍යයක් ලෙස ද භාවිත වූ බව පෙනේ. එක් අතකින් බලන විට තම අවශ්‍යතා කවි රචනා කිරීම මගින් ඉටු කරගන්නට යොමු වූ ලේඛක පිරිස අතරට තමන් ලියූ කවිවලට සිය පොද්ගලික අත්දැකීම් විෂය කරගන්නට නැඹුරු වූ අය ද වූ බව පෙනේ. ගජමන් නෝනාගේ රචනා අතර මෙම දෙවර්ගයම දැකිය හැකිය. ඉහත සඳහන් කළ පරිදි තම ජීවිත කාලය තුළදී විවිධාකාර දුක්ඛ දෙර්මනස්සයන්ට මුහුණ දුන් ගජමන් නෝනා බොහෝ විට එම දුක්ඛිත අත්දැකීම් තමන්ගේ රචනාවලට පාදක කරගත්තාය. එමෙන්ම ජීවිතයේ පසු කාලයේදී ඇය මුහුණ දුන් බොහෝ ප්‍රශ්නවලට විසඳුම් ලෙස ද, කවියෙන් කළ ඉල්ලීම් ප්‍රයෝජනයට ගත්තාය.

මෙම කිවිඳියගේ පොද්ගලික ජීවන අත්දැකීම් අතර පියාගේ මරණය සැලකිය යුතු තැනක් ගනියි. ඇතුන් බලාගැනීමේ රාජකාරියෙහි නිරතව සිටි ගජමන් ආරච්චි, එනම් ගජමන් නෝනාගේ පියාණන් ඇතකු විසින්ම මරා දමනු ලැබූ සිදුවීම මෙම කිවිඳියගේ කවිත්වය ඉස්මතු වී ඒමට මග පෑදූ බේදනීය අත්දැකීමක් විය. තමන් පොද්ගලිකව ලද අත්දැකීමක් අතිශය සංවේදී ලෙසත්, රසවත් ලෙසත් කවියට නැගීමට මෙම සිදුවීම ඇයට පිටිවහල් විය. වසර 1800 වන විට ගජමන් නෝනා පනස් හතර වන වියේ පසු වූ ගැහැනියක් වූවාය. තම පියා ඇතකු විසින් පාගා මරා දමනු ලැබීම නිසා ඇයට අත් වූ වියෝ දුක දරාගත නොහැකි වීමෙන් ඇය තම නිර්මාණ ශක්තිය මෙහෙයවමින් කරුණ රසයෙන් යුත් පැදි කිහිපයක් නිර්මාණය කර ඇත.

"මා පිය පියා මැරුවෙද රුදු මත වරණ
මා පිය පියා කරවා ඒ රුදු කමින
මා පිය පියා ගිඳි නොව දල සෝ දුකින
මා පිය පියා සිගි කර හඬමි හැම දින"

මෙගිඳි කිවිඳිය කවියේ බාහිර ආකෘතිය ගැන වැඩි අවධානයක් යොමු කර ඇති අතර එළිවැට රකින්නට ද උනන්දුවක් දක්වා ඇත. මාතර පද්‍ය සාහිත්‍යයෙහි එළිසමය රකිමින් ලියවුණ කාව්‍ය බහුලව දක්නට ලැබේ. ගජමන් නෝනා කිවිඳිය පද්‍ය රචනයට යොදාගත් අනෙකුත් විරිත් අතරට මෙවැනි ආකෘති යොදාගනිමින් ලියූ රචනා ද දැකගත හැකිය.

ගජමන් නෝනාගේ ප්‍රබන්ධ අතර අපට හමු වන තවත් රසවත් කවි පෙළකට ද වස්තු විෂය වී ඇත්තේ තම දයාබර පියාණන්ගේ අකාල මරණයයි.

"සුපසන් ගුණ නුවණ දිළුම් මහ
ගජමන් යන නම පැවතුම් කළ
මනුවන් යුග සඳිසි මපිය තනි
මගකට පිවිසිලා

එතමන් පෙර කරපු පවින් යළි
වෙසෙසින් රුදු සතුරු බයන් කර
මගකින් මහ සතුරු වෙමින් සිය
පතයෙන් තොර වියේ

නිසකින් එ අසල පිවිසුන් රුදු
ගිපිඳුන් තද පහර දෙමින් බිම
හෙළමින් හෙම අවරගිරෙන් බටු
විලසින් සැඟවීයේ"

නුදෙක් එළිසමය රැකීම අකැරටම පිළිපදිනු වෙනුවට මෙගිඳි කිවිඳිය, යොදාගත් විෂයට අදාළ ළයාන්විත බවකින් පිරි යෙදුම් ගළපාගත හැකි ආකෘතියකට යොමු වී ඇත.

කවි රචනයේදී මෙම කිවිඳිය සතු සෙසු දක්ෂතා අතර භාෂා ඥානය අතින් පෑ දක්ෂතාව ඉමහත්ය. ඒ සමගම කාව්‍ය රචනයේදී අවශ්‍ය වන ප්‍රතිභාව මෙම රචනා තුළින් කැපී පෙනෙන බව ද ප්‍රකටය. සූර්යයා අස්තංගත වීම, නැතහොත් ගිරු අවරගිරෙන් බැස යාම තම දයාබර පියාණන්ගේ ක්ෂණික අභාවය සමග ගළපමින් කාව්‍යෝචිත ලෙස ඉදිරිපත් කරන ගජමන් නෝනා කිවිඳියගේ කාව්‍ය නිර්මාණ කුසලතාව එදා මෙදාතුර රසිකයන්ට රසයක් විඳගැන්මට ඉඩකඩ සලසා ඇත. අදාළ ගම් පියසෙහි වග කිව යුතු තනතුරක් දරමින් මහගු සේවයක් ඉටු කරමින් විසූ ගජමන් ආරච්චිගේ අභාවය මුළු ගමටම ගිරු බැස යාමක් වැනි යයි පවසන කිවිඳිය මෙගිඳි පොද්ගලිකත්වය යටපත් වී පොදු අනුභූතියක් මතු වන සේ රචනා කොට තිබීම වැදගත් කරුණකි.

පියාගේ අභාවය ගජමන් නෝනා කිවිඳියගේ ජීවිතයටම බලවත් පහරක් එල්ල කළ අවාසනාවන්ත සිදු වීමක් විය. එයින් අනතුරුව ඇය විවාහ ජීවිත දෙකකින් පරාජයට පත් වෙමින් තම දරු පැටවුන් හදා වඩාගැනීමේ අසීරු කර්තව්‍යයට මුහුණ දුන් ආකාරය ද කවියෙන්ම ලියවී ඇති අවස්ථා බොහෝය. එම සිදුවීම් සමග තමන්ට ආර්ථික වශයෙන් එල්ල වූ අභියෝග ද එමතු නොව වැන්දඹුවක් ලෙස දිවි ගෙවද්දී මුහුණ දෙන්නට සිදු වූ වෙනත් අවාසනාවන්ත සිදුවීම් ද මෙම කිවිඳියගේ අභිකූත් කවි රචනාවලින් දැකගත හැකිය.

එවකට විසූ ලේඛකාවන්ගේ ජීවන ගමනේදී ඔවුන් මුහුණ පෑ විවිධාකාර බාධක හා අභියෝග මාතර සාහිත්‍යයෙන් ප්‍රකට වෙයි. ඒ අතර ගජමන් නෝනා කිවිඳියගේ ජීවිතයට බලපෑ නානාවිධ බාහිර